සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි

# විධායක (ජීව වෛද්‍ය ඉංජිනේරු ) සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

**01**. සම්බන්ධ වන ආයතන

**1.1** දෙපාර්තමේන්තුව : අදාළ නොවේ

**1.2** අමාත්‍යාංශය : සෞඛ්‍ය යොමු අංකය: 06/E/B.Eng./Recru./01/2013 දිනය:2013.01.16
: 07/E/01/02/01/2020 දිනය:2020.04.29

**1.3** කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය : DMS/C1/H&N/C-Vol.ii දිනය:2013.01.22
: DMS/0016/006 දිනය:2019.07.17

**1.4** ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය
යොමු අංකය:EST-3/RECRU/04/6639 දිනය:2012.12.10
:EST/2/02/REC/0924(I) දිනය:2019.10.31

**1.5** ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය:NSCC/4/13/SR-11 දිනය:2012.12.24
:NSCC/4/13/SR-11 දිනය:2019.08.09

**1.6** රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය
යොමු අංකය:PSC/EST/3/1/13/4/2013 දිනය:2013.12.20
1 වන සංශෝධනය :PSC/EST/3/1/13/4/2013 දිනය:2020.10.22
2 වන සංශෝධනය:PSC/EST/3/1/13/4/2013 දිනය :2021.04.28
3 වන සංශෝධනය:PSC/EST/3/1/13/4/2013 දිනය :2022.01.13
4 වන සංශෝධනය:PSC/EST/3/1/13/4/2013 දිනය :2022.08.30

**02.**පත් කිරීමේ බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03**. සේවා ගණය පිළිබඳ විස්තර

**3.1** සේවා ගණය : විධායක

**3.2** ශ්‍රේණි : III, II, සහ I ශ්‍රේණි

3.3 පැවරෙන කාර්යභාරය

පිළිබඳ පොදු නිර්වචනය : ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයේ පොදු ස්වභාවය අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය උපකරණවලට අවශ්‍ය නිර්ණායක, පිරිවිතර හා අදාළ කරුණු සකස් කිරීම ඒවා කළමනාකරණය කිරීම, සේවා හා නඩත්තු කිරීම, වෛද්‍ය උපකරණ සම්බන්ධ පුහුණු කටයුතු පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, විධානය/අණ දීම හා ඒ සම්බන්ධ තීරණ ගැනීම යන කාර්යයන්ට ඇතුලත් වූ ද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ට පැවරෙන සමස්ථ කාර්යභාරයේ වෛද්‍ය උපකරණ සඳහා අන්තර්ගත කාර්යයන් අතරින් තනතුරට නිශ්චිත කොට පවරා දෙනු ලබන කාර්යයන්.

3.4 කාර්යයන් පැවරීම :ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි/තනතුරුවල ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : SL 1-2016

5.2 වැටුප් පරිමාණය : රු: 47,615-10X1,335-8 X 1,630-17 X 2,170- 110,895/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | 47,615 |
| II | පියවර 12 | 62,595 |
| I | පියවර 20 | 76,175 |

## 06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

### 6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ජීව වෛද්‍ය ඉංජිනේරු) | I | 01 | එක් එක් තනතුරට අදාළ කාර්යයන් ඇමුණුම 01 යටතේ ඇතුළත් කර ඇත |
| අධ්‍යක්ෂ (ජීව වෛද්‍ය ඉංජිනේරු) | I | 01 | |
| ජ්‍යෙෂ්ඨ ජීව වෛද්‍ය ඉංජිනේරු | I/II | 03 | |
| ජීව වෛද්‍ය ඉංජිනේරු | II/III | 25 | |

### 6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව:

උසස් කිරීමේ කාර්යය සඳහා III, II හා I ශ්‍රේණිවල නිලධරයන් ඒකාබද්ධ සේවක සංඛ්‍යාවක් ලෙස සැලකේ

| | |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ජීව වෛද්‍ය ඉංජිනේරු) | - 01 |
| අධ්‍යක්ෂ (ජීව වෛද්‍ය ඉංජිනේරු) | - 01 |
| ජ්‍යෙෂ්ඨ ජීව වෛද්‍ය ඉංජිනේරු | - 03 |
| ජීව වෛද්‍ය ඉංජිනේරු | - 25 |
| | 30 |

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

### 7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| අනු අංකය | අනුමත තනතුර | ධාරාව | ප්‍රතිශතය |
|---|---|---|---|
| 1. | ජීව වෛද්‍ය ඉංජිනේරු | විවෘත | 100% |
| | | සීමිත | නැත |
| | | කුසලතා | නැත |

7.2 විවෘත බඳවා ගැනීම:

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්ව විද්‍යාලයකින් හෝ එම කොමිෂන් සභාව උපාධි ප්‍රදානය කරන ආයතනයක් ලෙස පිළිගෙන ඇති ආයතනයකින් ලබාගත් එම කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබ ඇති වසර 04 පූර්ණකාලීන විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් විද්‍යුත්/ විදුලි/ යාන්ත්‍රික/ ජීව වෛද්‍ය යන ක්ෂේත්‍රයක් යටතේ ලබා තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ඉංජිනේරු වෘත්තිකයකු ලෙස ලියාපදිංචි වී තිබීම

7.2.2.3 පළපුරුද්ද : විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 21 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 35 ට නොවැඩි

7.2.4. බඳවා ගැනීමේ ක්‍රමය :

7.2.4.1 ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
| --- | --- | --- |
| විෂයානුබද්ධ දැනුම | 100 | 40% |
| අභියෝග්‍යතා පරීක්ෂණය | 100 | 40% |

ලිඛිත පරීක්ෂණය පිළිබඳ විස්තර ඇමුණුම 02 හි දැක්වේ.

සටහන: බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණයේදී ලබා ගත් මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරුවලට බඳවා ගනු ලැබේ.

**7.2.4.1.1** ලිඛිත විභාගය පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

**7.2.4.2 වෘත්තීය පරීක්ෂණය :** අදාළ නොවේ.

**7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය**

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදුකරනු ලබන අතර ලකුණු ලබා දීමක් සිදු නොවේ.

**7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා:** රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**7.2.4.4** යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

**7.2.5** අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියෙහි දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**7.3 සීමිත බඳවා ගැනීම** : අදාළ නොවේ

**7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම :** අදාළ නොවේ.

**08.** කාර්යක්ෂමතා කඩඉම් :

**8.1**

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වැනි ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03)ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය - ඇමුණුම 03 |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වැනි ශ්‍රේණියට උසස් වී වසර තුන (03)ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය - ඇමුණුම 04 |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වැනි ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගතවීමට පෙර | සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන හැකියා ප්‍රවර්ධන පාඨමාලාවක් සම්පූර්ණ කිරීම මගින් මෙම අවශ්‍යතාවය සපුරාලිය යුතුය. |

**8.2** කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

**8.3** කාර්යක්ෂමතා කඩඉම්වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද :

| | |
|---|---|
| 01 වන කාර්යක්ෂමතා කඩඉම<br>02 වන කාර්යක්ෂමතා කඩඉම<br>03 වන කාර්යක්ෂමතා කඩඉම | සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් |

**09.** භාෂා ප්‍රවීණතාවය

**9.1**

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය. |
| 2.අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම

### 10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

#### 10.1.1.සාමාන්‍ය කාර්යය සාධනය අනුව

**10.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :**

(i) පත්වීම ස්ථිර කර තිබීම.

(ii) සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10)ක් උපයාගෙන තිබීම.

(iii) අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය(10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) <u>රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.</u>

(v) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

(vi) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

**10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :**

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය කාර්යය සාධනය අනුව

10.2.1.1 සපුරා ලිය යුතු සුදුසුකම්

(i) පහත සඳහන් ක්ෂේත්‍රයක් යටතට ගැනෙන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්ව විද්‍යාලයකින් හෝ එම කොමිෂන් සභාව උපාධි ප්‍රදානය කරන ආයතනයක් ලෙස පිළිගෙන ඇති ආයතනයකින් ලබාගත් එම කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පශ්චාත් උපාධියක් ලබා තිබීම.

1. ජීව වෛද්‍ය ඉංජිනේරු (Biomedical Engineering)
2. විද්‍යුත් ඉංජිනේරු (Electronic Engineering)
3. විදුලි ඉංජිනේරු (Electrical Engineering)
4. යාන්ත්‍රික ඉංජිනේරු (Mechanical Engineering)
5. ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව (Applied Electronics)
6. විද්‍යුත් හා ස්වයංක්‍රීයකරණය (Electronic & Automation)
7. සෞඛ්‍ය තාක්ෂණ කළමනාකරණය (Healthcare Technology Management)
8. ඉංජිනේරු කළමනාකරණය (Engineering Management)

සටහන : මෙම සංශෝධනයන් අනුමත කරනු ලැබූ දිනය දක්වා පැවති විධිවිධාන අනුව අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් සඳහා හෝ අදාළ සුදුසුකම ඉදිරි දිනයකදී සම්පූර්ණ කිරීම සඳහා දැනටමත් ලියාපදිංචි වී ඇති නිලධාරීන් සඳහා හෝ මෙම සංශෝධනයේ 10.2.1.1(i) යටතේ සඳහන් සුදුසුකම වෙනුවට කලින් සඳහන් සුදුසුකම සලකා බලනු ලැබේ.

හෝ

ඉංජිනේරු ආයතනයේ පූර්ණ සාමාජිකත්වය (වරලත් ඉංජිනේරු තත්ත්වය) හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් ඉංජිනේරු ආයතනයක පූර්ණ සාමාජිකත්වය (වරලත් ඉංජිනේරු තත්ත්වය) ලබා තිබීම හා එම පූර්ණ සාමාජිකත්වය අඛණ්ඩව පවත්වාගෙන යමින් තිබීම

(ii) සේවා ගණයේ II ශ්‍රේණියේ වසර (07) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හත (07) ක් උපයාගෙන තිබීම.

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

(iv) අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර හත(07) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(v) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

**10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය**

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

සංලක්ෂය :

සාමාන්‍ය මට්ටමේ කාර්යය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

## 11. තනතුරු වලට පත් කිරීම

**සුදුසුකම්**

**11.1** <u>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ජීව වෛද්‍ය ඉංජිනේරු)</u>

<u>**මූලික සුදුසුකම්**</u>

I. <u>විධායක නිලධර ගණයේ I ශ්‍රේණියේ වසර 5ක සේවා පළපුරුද්දකින් යුත් ජීව වෛද්‍ය ඉංජිනේරු නිලධාරියෙකු වීම සහ අධ්‍යක්ෂ (ජීව වෛද්‍ය ඉංජිනේරු) තනතුරේ අවම වශයෙන් එක් වසරක (01)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.</u>

යෝග්‍යතා ඇගයීමේ පරීක්ෂණය

| ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 01.I ශ්‍රේණියේ සේවා පළපුරුද්ද | 60 |
| 02.අමතර අධ්‍යාපන සුදුසුකම් | 10 |
| 03.අමතර වෘත්තීය සුදුසුකම් | 10 |
| 04.ක්ෂේත්‍රයට අදාළව සිදුකර ඇති නව නිපදවීම් හා පර්යේෂණ | 15 |
| 05.සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 |
| මුළු ලකුණු | 100 |

සටහන

1. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන විස්තරාත්මක ලකුණු පටිපාටිය අයදුම්පත් කැඳවීමේ නිවේදනයට ඇතුළත් කර ප්‍රසිද්ධ කරනු ලබන අතර එම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.
2. සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තනතුරට පත් කරනු ලැබේ.

**11.2 අධ්‍යක්ෂ (ජීව වෛද්‍ය ඉංජිනේරු)**

මූලික සුදුසුකම්

I. විධායක නිලධර ගණයේ I ශ්‍රේණියේ ජීව වෛද්‍ය ඉංජිනේරු නිලධාරියෙකු වීම සහ ජ්‍යෙෂ්ඨ ජීව වෛද්‍ය ඉංජිනේරු තනතුරේ අවම වශයෙන් එක් වසරක (01)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

යෝග්‍යතා ඇගයීමේ පරීක්ෂණය:

| ලකුණු ලබා දෙන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 01.I ශ්‍රේණියේ සේවා පළපුරුද්ද | 50 |
| 02.අමතර අධ්‍යාපන සුදුසුකම් | 10 |
| 03.අමතර වෘත්තීය සුදුසුකම් | 10 |
| 04.ක්ෂේත්‍රයට අදාළව සිදුකර ඇති නව නිපදවීම් හා පර්යේෂණ | 25 |
| 05.සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 |
| මුළු ලකුණු | 100 |

සටහන

1. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන විස්තරාත්මක ලකුණු පටිපාටිය අයදුම්පත් කැඳවීමේ නිවේදනයට ඇතුළත් කර ප්‍රසිද්ධ කරනු ලබන අතර එම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. → සං.01
2. සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තනතුරට පත් කරනු ලැබේ.

**11.3 ජ්‍යෙෂ්ඨ ජීව වෛද්‍ය ඉංජිනේරු**

මූලික සුදුසුකම් :

I. විධායක නිලධර ගණයේ I හෝ II ශ්‍රේණියේ ජීව වෛද්‍ය ඉංජිනේරු නිලධාරියෙකු වීම.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය:

| ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 01.II ශ්‍රේණියේ හෝ ඊට ඉහළ ශ්‍රේණියක සේවා පළපුරුද්ද සඳහා | 50 |
| 02. අමතර අධ්‍යාපන සුදුසුකම් | 10 |
| 03. අමතර වෘත්තීය සුදුසුකම් | 10 |
| 04. ක්ෂේත්‍රයට අදාළව සිදුකර ඇති නව නිපදවීම් හා පර්යේෂණ | 25 |
| 05. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 |
| මුළු ලකුණු | 100 |

සටහන

1. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන විස්තරාත්මක ලකුණු පටිපාටිය අයදුම්පත් කැඳවීමේ නිවේදනයට ඇතුළත් කර ප්‍රසිද්ධ කරනු ලබන අතර එම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.
2. සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තනතුරට පත් කරනු ලැබේ.

**12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :**

i. මෙම සේවා ගණයට සිදු කරනු ලබන සියලුම පත් කිරීම්/ බඳවා ගැනීම් මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධානයන්ට තරයේ අනුකූල වන පරිදි පමණක් විය යුතුය.

ii. බඳවා ගැනීම, සේවයේ යෙදවීම, විනය හා අනෙකුත් ආයතනික කටයුතු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ කොන්දේසි/ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති 1 කාණ්ඩයේ විධිවිධාන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පවරනු ලබන විධිවිධාන අදාළ වේ.

**13.** **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට** පරිබාහිර **වන්නා වූ අර්ථ නිරූපණ :**

"සක්‍රීය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ."

**14.** **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :** ඇමුණුම 05

**15.** **සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති වල දැක්වෙන කොන්දේසි** හා ආයතන **සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.**

**16.** **මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලකා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.**

**17.** **අන්තර්කාලීන විධිවිධාන: මෙම සංශෝධනයන් අනුමත කරනු ලැබූ දිනය දක්වා පැවති විධිවිධාන අනුව අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කර ඇත්නම් හෝ එම සුදුසුකම ලබා ගැනීම සඳහා ලියාපදිංචි වී අදාළ සුදුසුකම ඉදිරි දිනයකදී සම්පූර්ණ කරනු ලබන්නේ නම් හෝ මෙම සංශෝධනයේ 10.2.1.1.(i) යටතේ සඳහන් සුදුසුකම වෙනුවට එම සුදුසුකම සලකා බලනු ලැබේ.**

## ඇමුණුම - 01

**<u>එක් එක් තනතුරට අදාළ කාර්යයන්</u>**

| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ජීව වෛද්‍ය ඉංජිනේරු) | |
|---|---|
| i | ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයට අදාළ රාජකාරි සැලසුම් කිරීම, ප්‍රතිපත්ති සැකසීම සහ අධීක්ෂණ කටයුතු සිදු කිරීම. |
| ii | ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ සාමාන්‍ය පරිපාලන කටයුතු |
| iii | සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින රෝහල්වලට අවශ්‍ය වෛද්‍ය උපකරණ ලබා ගැනීම, බෙදා හැරීම සහ සේවා නඩත්තු කටයුතුවලදී සෞඛ්‍ය ලේකම්/ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදේශාත්මක සේවා සැපයීම. |
| iv | අධ්‍යක්ෂ (ජීව වෛද්‍ය ඉංජිනේරු), ජ්‍යෙෂ්ඨ ජීව වෛද්‍ය ඉංජිනේරු, ජීව වෛද්‍ය ඉංජිනේරු, ගණකාධිකාරි සහ පරිපාලන නිලධාරී යන නිලධාරීන්ගේ රාජකාරි නිවැරදි අයුරින් ඉටු වන ආකාරයට ඔවුන් මෙහෙයවීම හා උපදෙස් ලබා දීම |
| v | පළාත් ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකයන්හි කළමනාකරණ කටයුතු |
| vi | අධ්‍යක්ෂ (ජීව වෛද්‍ය ඉංජිනේරු), ජ්‍යෙෂ්ඨ ජීව වෛද්‍ය ඉංජිනේරු, ජීව වෛද්‍ය ඉංජිනේරු යන නිලධාරීන්ගේ සහ අදාළ රෝහල්වල වෛද්‍ය උපකරණ භාවිතා කරන නිලධාරීන්ගේ කුසලතා වර්ධනය කිරීම සඳහා පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම, පුහුණු වැඩසටහන් සකස් කිරීම සහ අදාළ පුහුණු වැඩසටහන් සඳහා එම නිලධාරීන් යොමු කිරීම |
| vii | තමන්ගේ විෂය පථයට අදාළ ආයතනවලට අවශ්‍ය වෛද්‍ය උපකරණ අවශ්‍යතා හඳුනා ගැනීම සහ ඒ සම්බන්ධ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කිරීම |
| viii | ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි |

| අධ්‍යක්ෂ (ජීව වෛද්‍ය ඉංජිනේරු) | |
|---|---|
| i | ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයට අදාළ පරිපාලන සහ අධීක්ෂණ කටයුතුවලට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ජීව වෛද්‍ය ඉංජිනේරු)ට සහාය වීම |
| ii | ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ සාමාන්‍ය පරිපාලන කටයුතු |
| iii | සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින රෝහල්වලට අවශ්‍ය වෛද්‍ය උපකරණ ලබා ගැනීම, බෙදා හැරීම සහ සේවා නඩත්තු කටයුතු මෙහෙයවීම සහ එම කටයුතුවලදී නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ජීව වෛද්‍ය ඉංජිනේරු) වෙත සහය වීම |
| iv | ප්‍රසම්පාදන කමිටු සඳහා සහයෝගය ලබාදීම සහ වෛද්‍ය උපකරණ මිලදී ගැනීමේදී තාක්ෂණික පිරිවිතර සැකසීම |
| v | ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ ජ්‍යෙෂ්ඨ ජීව වෛද්‍ය ඉංජිනේරු, ජීව වෛද්‍ය ඉංජිනේරු, ගණකාධිකාරි සහ පරිපාලන නිලධාරි යන නිලධාරීන්ගෙන් රාජකාරි කටයුතු අධීක්ෂණය කිරීම |
| vi | ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි |

| ජ්‍යෙෂ්ඨ ජීව වෛද්‍ය ඉංජිනේරු |
|---|
| i ජීව වෛද්‍ය ඉංජිනේරු සහ තාක්ෂණ කාර්ය මණ්ඩලය පුහුණු කරවීම<br>ii පළාත් ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකවල සහ ආයතනයේ නඩත්තු අංශවල වෛද්‍ය උපකරණවල නඩත්තු කටයුතු අධීක්ෂණය කිරීම සහ එම ඒකකවල අංශ භාර ඉංජිනේරුවරුන්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ (ජීව වෛද්‍ය ඉංජිනේරු) වෙත සහය වීම<br>iii ප්‍රසම්පාදන කමිටු සඳහා සහයෝගය ලබා දීම සහ වෛද්‍ය උපකරණ මිලදී ගැනීමේදී තාක්ෂණික පිරිවිතර සැකසීම<br>iv ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි |
| ජීව වෛද්‍ය ඉංජිනේරු |
| i අනුයුක්ත කර ඇති අංශයන්හි සියලුම කාර්ය මණ්ඩලයේ සියලුම අධීක්ෂණ කටයුතු<br>ii වෛද්‍ය උපකරණ මිලදී ගැනීමේදී පිරිවිතර සහ ප්‍රසම්පාදන ලියකියවිලි සැකසීම සහ තාක්ෂණ ඇගයීම් කටයුතු සිදු කිරීම<br>iii වෛද්‍ය උපකරණ අලුත්වැඩියා සහ නඩත්තු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැකසීම සහ අමතර කොටස් නිසි පරිදි ඇණවුම් කර තොග පවත්වා ගැනීම<br>iv සේවා සහ නඩත්තු ගිවිසුම් අධීක්ෂණය කිරීම සහ නිර්දේශ ලබා දීම<br>v ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි |

## ඇමුණුම - 02

**සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයෙහි ජීව වෛද්‍ය ඉංජිනේරු තනතුරට බඳවා ගැනීමේ ලිඛිත තරඟ විභාගය**

**01.** විභාගයේ නම : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා ගණයේ (SL-1) III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා වන ලිඛිත තරඟ විභාගය

**02.** විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01.විෂයානුබද්ධ දැනුම | පැය 02 යි | 100 | 40% |
| 02.අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 යි | 100 | 40% |

**03.** විභාගය පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක්

**04.** විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : තනතුරුවල පුරප්පාඩු ඇති වීම මත

**05.** විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | ප්‍රශ්න පත්‍රය සකස් විය යුතු ආකාරය | ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. විෂයානුබද්ධ දැනුම | විද්‍යුත්/විදුලි/යාන්ත්‍රික/ජීව වෛද්‍ය ඉංජිනේරු යන ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළ සිද්ධාන්ත දැනුම මැන බැලීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ. | රචනා ප්‍රශ්න 06කින් ප්‍රශ්න 04ක් සඳහා පිළිතුරු සැපයිය යුතුය. | එක් ප්‍රශ්නයකට ලකුණු 25 බැගින් ප්‍රශ්න 04ක් සඳහා ලකුණු 100 |
| 02. අභියෝග්‍යතා පරීක්ෂණය | සේවයේ රාජකාරී සඳහා අදාළ යෝග්‍යතාවය හා හැකියාව පරීක්ෂා කිරීමට තර්කන ශක්තිය, ගණිත ගැටළු, භාෂා හැකියාව යනාදිය ආශ්‍රයෙන් ඉදිරිපත් කරන ප්‍රශ්න පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමානිකරණය, කාලය හා අවකාශය අතර සම්බන්ධතාවය ආශ්‍රයෙන් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ. | බහුවරණ ප්‍රශ්න 50ක් සඳහා පිළිතුරු සැපයිය යුතුය. | එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ප්‍රශ්න 50ක් සඳහා ලකුණු 100 |

සටහන : මෙම විභාගය තරඟ විභාගයක් වුවද එක් එක් විෂයක් සඳහා වෙන් කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් ලකුණු 40% ක් වත් අපේක්ෂකයා විසින් ලබා ගත යුතුය.

ඇමුණුම - 03

<u>සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ජීව වෛද්‍ය ඉංජිනේරු සඳහා III ශ්‍රේණියේ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>

**01.** විභාගයේ නම : ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා ගණය (SL - 1- 2016) III ශ්‍රේණිය සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

**02.**විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.ආයතන රෙගුලාසි | පැය 03යි | 100 | 40% |
| 2.මුල්‍ය ක්‍රම | පැය 03යි | 100 | 40% |
| 3.දෙපාර්තමේන්තු රෙගුලාසි | පැය 03යි | 100 | 40% |

**03.** විභාගය පවත්වනු ලබන බලධරයා :සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත ආයතනයක්

**04.**පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

**05.**විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.ආයතන රෙගුලාසි | ආයතන සංග්‍රහයේ<br>XII පරිච්ඡේදය - නිවාඩු<br>XV පරිච්ඡේදය - අධ්‍යයන, අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යෑම.<br>XVI පරිච්ඡේදය - නිවාඩු ගමන්<br>XXVIII පරිච්ඡේදය- පරිපාලන කාර්ය පරිපාටි සහ විධි<br>XXX පරිච්ඡේදය - රජයේ නිළධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල<br>XXXIII පරිච්ඡේදය- නීති උපදෙස් හා නීති ක්‍රියාමාර්ග<br>XLVII පරිච්ඡේදය - සාමාන්‍ය හැසිරීම සහ විනය<br>XLVIII පරිච්ඡේදය- විනය කාර්ය පරිපාටිය පිළිබඳ රීති<br><br>❖ <u>අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති</u> |
| 02. මුල්‍ය ක්‍රම | මුදල් රෙගුලාසි සංග්‍රහය<br>I. පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තුව<br>II. පරිච්ඡේදය - වියදම්, අත්හැර දැමීම්, ආපසු ගෙවීම් ආදිය සඳහා අධිකාර බලය<br>III. පරිච්ඡේදය - මුදල් පාලනය හා ගිණුම් ගත කළ හැකි වීම |

| | |
|---|---|
| | IV. පරිච්ඡේදය - ලැබීම<br>V. පරිච්ඡේදය - ගෙවීම<br>VI. පරිච්ඡේදය - ආණ්ඩුවේ මුදල යනාදියේ භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්<br>X. පරිච්ඡේදය - උසාවිවල ගිණුම්<br>XI. පරිච්ඡේදය - විදේශ ආධාර<br>XIII. පරිච්ඡේදය - සැපයුම් වැඩ හා සේවා<br><br>❖ රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය |
| 03. දෙපාර්තමේන්තු රෙගුලාසි | <u>රෝගී සත්කාර සේවාවට අදාළ රෙගුලාසි, ප්‍රසම්පාදන ලියකියවිලි, සේවා සහ නඩත්තු ගිවිසුම්</u> |

## ඇමුණුම - 04

**සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ජීව වෛද්‍ය ඉංජිනේරු II ශ්‍රේණියේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

**01.** විභාගයේ නම : ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා ගණය (SL - 1-2016) II ශ්‍රේණිය සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

**02.** විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. විෂයය දැනුම | පැය 03 යි | 100 | 40% |

**03.** විභාගය පවත්වනු ලබන බලධරයා: සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත ආයතනයක්

**04.** විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග: වසරකට දෙවරක්

**05.** විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයය දැනුම | පහත සඳහන් වෛද්‍ය උපකරණවලට අදාළව,<br>• උපකරණ පිළිබඳ මූලධර්ම (Equipment principles)<br>• අළුත්වැඩියාව හා නිවාරණය නඩත්තු ක්‍රමවේද (Corrective and preventive maintenances)<br>• අමතර කොටස් හඳුනාගැනීම (Identification of spare parts)<br>• වෛද්‍ය උපකරණ ක්‍රමාංකණය කිරීම (Calibration of medical equipment)<br>• පිරිවිතර සෑදීම (Formation of specifications)<br>යන කරුණු යටතේ ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත. |

| | |
|---|---|
| 01. MRI Scanner | 08. Electrosurgical Unit |
| 02. CT Scanner | 09. Autoclave Machine |
| 03. X-Ray Machine | 10. Centrifuger |
| 04. ECG Machine | 11. Dental Unit |
| 05. Infusion Pump | 12. Suction Apparatus |
| 06. Ventilator | 13. Blood Pressure Apparatus |
| 07.Anesthetic Machine | 14. Operating Theatres Table |

ඇමුණුම - 05

<u>සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ජීව වෛද්‍ය ඉංජිනේරු සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණ කිරීම</u>

**(මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාල වේ.)**

නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 03/2016 මගින් ලබා දී ඇති SL-01-2016 වැටුප් පරිමාණ යටතේ වැටුප් ලබන නිළධාරීන් ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේ වෙතුදු අන්තර්ග්‍රහණය වෙනුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේ දී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළග ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකල යුතුය.

i. SL 01 – 2016 III ශ්‍රේණිය

(අ) SL 01 – 2016 III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසයින් අවුරුදු 10 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිළධාරීන්

(ආ) SL 01 – 2016 III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසයින් අවුරුදු 10 කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ ද II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිළධාරීන්

SL 01 – 2016 III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ii. SL 01 – 2016 II ශ්‍රේණිය

(අ) දැනට පවතින බඳවා ගැනීමේ පරිපාටිය යටතේ වූ කාර්යක්ෂමතා කඩඉම් හා අනෙකුත් සේවා අවශ්‍යතා සම්පූර්ණ කරන ලද SL 01 – 2016 III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සහිත නිළධාරීන්

SL 01 – 2016 II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

iii. SL 01 – 2016 I ශ්‍රේණිය

දැනටමත් SL 01 – 2016 I ශ්‍රේණියට අදාළ තනතුරකට ස්ථිරව පත් කර ඇති නිළධාරීන් SL 01 – 2016 I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.